# ලංසු සඳහා ආරාධනයයි
# ජාතික අධ්‍යාපන ආයතනය – මහරගම

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2025/2026 වර්ෂය සඳහා ආරක්ෂක සේවය සැපයීම හා පවත්වාගෙන යාම (NIE/LP/2025/06) සහ 2025/2026 වර්ෂය සඳහා මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යාම (NIE/LP/2025/79)**

ජාතික අධ්‍යාපන ආයතනයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ජාතික අධ්‍යාපන ආයතනයේ මහරගම සහ මීපේ පරිශ්‍රයන්හි පිහිටි ගොඩනැගිලි සහ භූමියේ ආරක්ෂක සේවය සඳහා පළපුරුදු, සුදුසුකම්ලත් ආරක්ෂක සේවා සපයනු ලබන ආයතනවලින්ද, මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ආපනශාලා /පිළිගත් රෙස්ටුරන්ට්/හෝටල් හිමියන් වෙතින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ. සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් එක් ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් සියළු විස්තර සහ පහත සඳහන් ලියවිලි ප්‍රසම්පාදන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් ඒකකයෙන් ප්‍රසම්පාදන ලියවිලි ලබා ගත හැක. එක් එක් ප්‍රසම්පාදන කාර්යයේ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රසම්පාදන කාර්යයේ නම හා ලංසු අංකය | ආපසු නොගෙවන තැන්පතුව (රු.) | ලංසු සුරක්ෂණ මුදල (රු.) | ප්‍රසම්පාදන ලියවිලි නිතුක් කරන අවසන් වන දිනය හා වේලාව | ප්‍රසම්පාදන ලියවිලි භාර ගැනීම අවසන් වන දිනය හා වේලාව | ලංසු විවෘත කරන දිනය හා වේලාව | ප්‍රසම්පාදන ලියවිලි නිතුක් කිරීම සඳහා අවශ්‍ය වන ලියවිලි |
|---|---|---|---|---|---|---|---|
| 01 | ජාතික අධ්‍යාපන ආයතනයේ ආරක්ෂක සේවය සැපයීම හා පවත්වාගෙන යාම (2025/2026 වර්ෂය) (NIE/LP/2025/06) | රු.3,500.00 | රු.300,000.00 | 2025.10.01 ප.ව 3.00 | 2025.10.02 ප.ව 2.00 | 2025.10.02 ප.ව 2.00 | ව්‍යාපාර නාම ආඥපනතේ 149වන ඡේදය යටතේ හෝ සමාගම් පනත යටතේ ආරක්ෂක සේවය සපයන ආයතනයක් ලෙස වලංගු ලියාපදිංචිය හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය යටතේ 2025 වසර සඳහා ලියාපදිංචි වී තිබීම හා ආපසු නොගෙවන තැන්පතුව බැර කර ලබා ගත් ලදුපත |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02 | මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ ආපනශාලාව (2025/2026 වර්ෂය) (NIE/LP/2025/79) | රු.1000.00 | රු.15,000.00 | 2025.10.08 ප.ව 3.00 | 2025.10.09 ප.ව 2.00 | 2025.10.09 ප.ව 2.00 | ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් හා ආපසු නොගෙවන තැන්පතුව බැර කර ලබා ගත් ලදුපත |

එක් එක් ප්‍රසම්පාදන කාර්යයට අදාල ආපසු නොගෙවනු ලබන තැන්පතුව ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය ගිණුම් අංක 607628 දරණ ගිණුමට TD25A00000A0 කේත අංකය යටතේ බැර කල යුතුය.

ඉහත එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලියවිලි මුද්‍රා තබා ඉහත සඳහන් පරිදි ප්‍රසම්පාදන ලියවිලි භාර ගන්නා අවසන් දිනට හා වේලාවට ප්‍රථම ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,ජාතික අධ්‍යාපන ආයතනය, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් එවීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. **ප්‍රසම්පාදන ලියවිල්ල බහාලන ලියුම් කවරයේ ප්‍රසම්පාදන කාර්යයේ නම, කොන්ත්‍රාත් /ලංසු අංකය හා ලංසුව විවෘත කරන දිනය සඳහන් කල යුතුය.**

මෙම ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අවසන් තීරණය ජාතික අධ්‍යාපන ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 011-7601799 / 011-7601797 අමතන්න.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.09.18